# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2021-02-01

පැමිණිලි පාර්ශවය : 01. වයි.පී. අශෝක කරුණාරත්න මයා
නො : 18, නදුන් උයන,
මොරගොඩ, ගම්පහ.

02. ආර්.එම්.පී.ඩබ්. විජිත කුමාර මයා.

03. ජ්.පී කාරියවසම් මයා

වගඋත්තර පාර්ශවය : 01. අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික තරුණ සේවා සභාව,
අංක 65, හයිලෙවල් පාර,
මහරගම.

02. අධ්‍යක්ෂ ජනරාල්,
කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව,
මුදල් අමාත්‍යාංශය, කොළඹ 01.

03. ලේකම්,
ජාතික වැටුප් කොමිෂන් සභාව,
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,
බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

<u>පැමිණිලි අංකය : HRC/845/17</u>

පැමිණිල්ල =:

ඉහත පැමිණිලිකරුවන් තම පැමිණිල්ල තුලින් දක්වා ඇත්තේ, ජාතික තරුණ සේවා සභාවේ I වන ශ්‍රේණියේ උපදේශක තනතුරේ සිට විශේෂ උපදේශක තනතුරට ඔවුන් උසස් කරන ලද නමුත් අදාල වැටුප් තලයේ පිහිටුවා නොමැති බවයි. 2006 වර්ෂයේ සිට අද දක්වා විශේෂ උපදේශක තනතුරේ සේවය කලද තනතුරට අදාල වැටුප් තලයේ පිහිටුවා නොතිබීමෙන් ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් කඩ වූ බව දක්වා ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවීය ජාතික තරුණ සේවා සභාව සදහන් කර ඇත්තේ, පැමිණිලිකරුවන් විශේෂ උපදේශක ලෙස කටයුතු කරන බවට එකග වන බවත් ඔවුන් මේ සම්බන්ධයෙන් වගකිවයුතු වගඋත්තරකරුවන් නොවන බවත්ය. 2006.01.01 දින සිට ක්‍රියාත්මක වූ කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 30ට අනුව කළමණාකරණ සහකාර (තාක්‍ෂණික) MA II-1 සේවා ගණයේ 10 වන පියවරට විශේෂ උපදේශක තනතුරට අදාල වැටුප් තලයේ පිහිටුවා ඇති බව ද සදහන් කර ඇත.

පරීක්‍ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-

පැමිණිල්ලට අදාලව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් සිදුකර ඇති අතර, එම පරීක්‍ෂණයේදී පැමිණිලිකරුවන් තරුණ සේවා සභාවේ උපදේශක I ශ්‍රේණියේ කටයුතු කරමින් සිටියදී විශේෂ උපදේශන සේවයට උසස්වීමක් ලබා ඇති නමුත් හිමිවියයුතු වැටුප් පියවරේ තබා නොතිබූ බවට පැමිණිලිකරුවන් කියා සිටින අතර, උපදේශක I ශ්‍රේණිය ලෙස පත්වීම් ලද තැනැත්තන් MA - III වැටුප් බාණ්ඩයේ පිහිටුවා ඇතත්, විශේෂ උපදේශක ලෙස උසස්වීම් ලද පැමිණිලිකරුවන් ඊට වඩා අඩු වැටුප් බාණ්ඩයක් වන MA-II වැටුප් බාණ්ඩයේ තබා ඇති බව පරීක්‍ෂණයේදී පෙන්වා දී ඇත.

පැමිණිලිකරුවන් එය නිවැරදි කරන ලෙස කරන ලද ඉල්ලීම් වගඋත්තරකරුවන් විසින් නොසලකා හරින ලද බැවින්, මෙම පෙත්සම ගොනු කර ඇති අතර, පැමිණිලිකරුවන් ඉල්ලා සිටින්නේ ඔවුන් JM වැටුප් බාණ්ඩයට අදාල වැටුප් පියවරේ තබන ලෙසට වේ.

පැමිණිලිකරුවන් තම ඉල්ලීම තරුණ සේවා සභාවේ අධ්‍යක්‍ෂ ජනරාල් වෙත ලිඛිතවම සිදු කර ඇති අතර, අධ්‍යක්‍ෂ ජනරාල් විසින් එම ඉල්ලීම සම්බන්ධයෙන් ගතහැකි පියවර පිළිබඳ විමසා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ජනරාල් වෙත හෝ වැටුප් කොමිෂන් සභාවේ ලේකම් වෙත හෝ ඉල්ලීමක් කර නොමැති බව 2018.02.16 දින පරීක්‍ෂණ අවස්ථාවේ ජාතික තරුණසේවා සභාවේ අධ්‍යක්‍ෂ ජනරාල් වෙනුවට පෙනී සිටි කළමණාකරණ සහකාර, අජිත් ප්‍රසාද් වරාපිටිය මහතා ඉදිරිපත් කල කරුණු අනුව පැහැදිලි වී ඇත. එහෙත් එකී කරුණු ස්ථිරවම තහවුරු කර ගැනීම සඳහා නැවත 2018.11.09 වන දින පරීක්‍ෂණය පවත්වා ඇති අතර, ඒ අනුව වගඋත්තරකරුවන්ගේ ලේඛන පරීක්‍ෂා කිරීමේදී පෙනී යන්නේ ජාතික තරුණ සේවා සභාව විසින් තම කරුණු අදාල අමාත්‍යාංශයේ ලේකම් මගින් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බවයි. එකී ලේඛන අනුව පැමිණිලිකරුවන්ගේ ගැටළු පිළිබඳව කරුණු දක්වා ඒවා විසදා ගැනීමට මැදිහත් වන ලෙස කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇති නමුත් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් පරීක්‍ෂණ අවස්ථාවලදී දක්වා ඇත්තේ, පැහැදිලි ඉල්ලීමක් තරුණ සේවා සභාව විසින්, ඔවුන්

වෙත ඉදිරිපත් කර නොමැති බවයි. තරුණ සේවා සභාව විසින් 2017 වසරේ සිට ඉල්ලීම් කිහිපයක් සිදු කර ඇති බව පැහැදිලි වේ. ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් එවකට එම සභාව අයත් අමාත්‍යාංශය වන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත අන්තර්ග්‍රහන ගැටළු සම්බන්ධව දක්වා, ඒවා නිරාකරණය කර ගැනීමට ඉල්ලීම් කර ඇති බවද නිරීක්ෂණය වේ. කරුණු පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ 2018.01.19 දින කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත සවිස්තරාත්මක කරුණු දක්වා පැමිණිලිකරුවන්ගේ ගැටළුව විසදීමට ක්‍රියාමාර්ග හා උපදෙස් ඉල්ලා ඇති බවය. 2018.12.18 දින අවසන් පරීක්ෂණය පැවති අතර. අනාවරණය වූ කරුණු අනුව පෙනී යන්නේ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉහත සදහන් දින තම ඉල්ලීම් පිළිබද දක්වා කරුණු වාර්තා කර තිබුණද කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලද ලේඛන වල එවැනි ලේඛනයක් නොමැති බවය.

නිරීක්ෂණ :-

2006 වසරට පෙර ජාතික තරුණ සේවා සභාව විසින් බඳවා ගැනීමේ පරිපාටිය අනුව උපදේශක තනතුරට අදාලව විශේෂ උපදේශක හා පළවන ශ්‍රේණියේ උපදේශක මෙන්ම උපදේශක II ශ්‍රේණිය ලෙස වර්ගීකරණ 03ක් යටතේ බඳවා ගැනීම් සිදු කර තිබී ඇති බව නිරීක්ෂණය වේ. විශේෂ උපදේශක ශ්‍රේණියට අවශ්‍ය සුදුසුකම් ලෙස තිබී ඇත්තේ අ.පො.ස (උ/පෙළ) හෝ අ.පො.ස (සා/පෙළ) සමත්වීම හෝ ඉහත සඳහන් සියළු සුදුසුකම් මත බඳවා ගැනීම් ලෙස වේ. පළමු ශ්‍රේණියට බඳවා ගැනීමේදී විශ්ව විද්‍යාලයක උපාධිය සහ අපොස (උ/පෙළ) සමග වෙනත් සුදුසුකම් ලෙස දක්වා තිබූ විවිධ සුදුසුකම් ඉල්ලා ඇති අතර. ඒ අනුව උපාධියක් කිරීම අත්‍යාවශ්‍ය නොවන බවක් මින් ගම්‍ය වන බව නිරීක්ෂණය වේ. ඊට හේතුව වන්නේ අවසාන සුදුසුකම ලෙස ජාතික තරුණසේවා සභාවේ ක්ෂේත්‍ර සහායක ලෙස වසර 05ක් සේවය කිරීමේ පළපුරුද්ද සමග තම තනතුරේ ස්ථිර කිරීමද ඊට ප්‍රමාණවත් බව දක්වා ඇති බැවිනි. තවද විශේෂ උපදේශක තනතුර සඳහා ඉල්ලා ඇත්තේ ද අ.පො.ස(උ/පෙළ) හෝ අපොස (සා/පෙළ) සමග සමාන සුදුසුකමක් සහ තවත් තාක්ෂණික පුහුණු සහතිකයක් තිබීම පමණක් වන බවද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුවන් තිදෙනෙකු ඉදිරිපත් වන අතර, ඔවුන් 2005 වසරට පෙර වසර 23ක් බැගින් පළමු ශ්‍රේණියේ පළපුරුද්ද ඇති දෙදෙනෙක් ද වසර 21 පළපුරුද්ද ඇති එක් අයෙක් ද වේ. එක් අයෙකු ජාතික තාක්ෂණික සහතිකය ද තවත් අයෙකු හට ජාතික කාර්මික අධ්‍යාපන ඩිප්ලෝමාව ද ඇති අතර. 2006 වසරේ නව බඳවා ගැනීමේ පරිපාටි සකස් කිරීමේදී විශේෂ උපදේශක සහ ශ්‍රේණිගත උපදේශන ක්‍රමය අහෝසි කොට උපදේශක හා විශේෂ උපදේශක එක් වර්ගීකරණයකට ගෙන විශේෂ උපදේශක ශ්‍රේණියේ සිටි පැමිණිලිකරුවන් MA -1 යන වැටුප් තලයේ පිහිටුවා පියවර 10ක් ඉදිරියට තබා ඇති බව නිරීක්ෂණය වේ.

එය මූලික වැටුප ලෙස සලකා මෙතෙක් උපයා ගන්නා ලද වැටුප් වර්ධක එක් එක් අය වෙත වෙන වෙනම ලබාදී ඇති අතර. I වන ශ්‍රේණියේ උපදේශක ලෙස එතෙක් කටයුතු කළ MA -III දරණ වැටුප් පියවරේ මූලික ආරම්භක වැටුප් පියවරේ තබා එය ආරම්භ වැටුප ලෙස සලකා එක් එක් අය උපයාගත් වැටුප් වර්ධක එයට එකතු කර ඇති බව පෙනී යයි. පැමිණිලිකරුවන් 2006 වසරට පෙර විශේෂ උපදේශක ලෙස උසස්වීම් ලබා තිබුණද ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨතාවය සලකා බලා ලබාදෙන ලද උසස්වීමක් ලෙස එය හඳුනාගත හැකි බව නිරීක්ෂණය වේ. අභ්‍යන්තර අයදුම්පත් කැඳවා 2005 වසරේදී එය උසස්වීමක් බවට තරුණසේවා සභාවේ සභාපති විසින් අදාළ බලධාරියා ලෙස අත්සන් තබා ඇති බවද ලේඛන ඉදිරිපත් කරමින් තහවුරු කර ඇත.

ජාතික වැටුප් කොමිෂන් සභාව ප්‍රකාශ කර ඇත්තේද. පැමිණිලිකරුවන්ගේ ගැටළුව විස්තරාත්මකව යොමු කර නොතිබූ බවත් එය යොමු කරන්නේ නම් ඊට අදාළව කොමිෂන් සභාවේ නිර්දේශය නිකුත් කළ හැකි බවත්ය. නමුත් ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දක්වා ඇත්තේ. පැමිණිලිකරුවන්ගේ අන්තර්ග්‍රහණය සම්බන්ධ ගැටළුව විසඳීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත 2017.03.09 වන දින යොමු කළ බවත්. එකී අමාත්‍යාංශයේ ලේකම් මගින් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ බවට 2018.01.15 දිනැති ලිපිය මගින් කරුණු තහවුරු කළහැකි බවත්ය. ඒ අනුව පැමිණිල්ලේ අදාළ වාර්තා තුළ අමුණා එවා ඇති ලේඛන අනුව එකී කරුණු තහවුරු වේ. මෙම ගැටළුව සම්බන්ධයෙන් ජාතික තරුණසේවා සභාව විසින් ජාතික වැටුප් කොමිෂන් සභාවට කරුණු ඉදිරිපත් කර ඇති බව අනාවරණය වුවද විශේෂ උපදේශක තනතුරට පැමිණිලිකරුවන් අන්තර්ග්‍රහණය කිරීමේදී සිදුවූ ගැටළුව නිරාකරණය කිරීම සඳහා වැටුප් කොමිෂන් සභාව හෝ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අදාළ අවස්ථාවේ උපදෙස් ලබාදී නොමැති බව නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

ඉහත සමස්ත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී. වගඋත්තරකරුවන් විසින් කටයුතු කර ඇති ආකාරය අනුව පැමිණිලිකරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමකට ලක්ව ඇති බව අනාවරණය වේ. එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය =:**

1. ජාතික තරුණ සේවා සභාව විසින් එවකට අදාළ අමාත්‍යාංශය වූ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ පැමිණිලිකරුවන්ගේ ගැටළු වලට

අදාළ ලේඛන 2018.01.15 දින කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත තම අංක ඒටී/1(8)පී2-viii – උප යටතේ යොමු කර ඇති බැවින් ඒ වෙත අවධානය යොමු කිරීමට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව කටයුතු කර පැමිණිලිකරුවන්ගේ ගැටළුවට අවශ්‍ය විසඳුම ලබාදීමට පියවර ගතයුතුය.

2. එසේම ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් පැමිණිලිකරුවන්ගේ ඉල්ලීම පිළිබඳව සලකා බලා විශේෂ උපදේශක තනතුරට අදාල නිවැරදි වැටුප් පියවරේ තැබීමට පියවර ගතයුතු බවද.

3. ජාතික තරුණ සේවා සභාවේ විශේෂ උපදේශක ශ්‍රේණියේ සහ I වන ශ්‍රේණියේ උපදේශක තනතුරු වලට අදාල වැටුප් විෂමතාවය කඩිනමින් විසඳීමට පියවර ගතයුතු බව ද.

4. 2006 වසරේ බඳවා ගැනීමේ 7 පටිපාටිය සැකසීමේදී විශේෂ උපදේශක තනතුරට හිමිවිය යුතුව තිබූ MA-4 වැටුප් භාණ්ඩයේ පිහිටුවීම කටයුතු කළ යුතු බවටද.

5. 2006 වසරේ සිට මේ දක්වා අවුරුදු 14ක පමණ කාලයක් අඛණ්ඩව විශේෂ උපදේශක තනතුරේ සේවය කර ඇති බැවින් උසස්වීම් පටිපාටියට අනුව 2012 වසරේ සිට JM වැටුප් තලයේ පිහිටුවා හිඟ වැටුප් සහ හිමිවිය යුතු අනෙකුත් වරප්‍රසාද ලබා දියයුතු බවටද මින් නිර්දේශ කරනු ලැබේ.

2021.03.31 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Ms. Anushya Shanmuganathan**
Commissioner
Human Rights Commission of Sri Lanka

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka